# පළමු වතාවට රෝහලක

අප අටේ පන්තියේ සිටින කාලයේ එක් දිනක සෙනෙවිරත්න සමග මා විද්‍යාගාරය අසලට ගියේ නිකමට ය. කතාකරමින් ය. විද්‍යාගාරයේ සිමෙන්තියෙන් සාදන ලද ලොකු මල් පාත්තියක සිටුවා තිබුණේ පතොක් විශේෂයකි. එවකට පතොක් ශාකය අපට ද විශේෂ ශාකයක් වූයේ ඒවා මීට පෙර නොදැක තිබූ නිසා ය. පත්‍ර පුරා කටු සහිත මෙම පැලෑටිය පිළිබඳව සෙනෙවිරත්න මට විස්තර කළේ එහි ඇති භයානකකම ගැන ය. මේවා ඇනුණොත් දෑත දෙපය කොරවන බවක් ඔහු පැවසුවේ බියකරු ලෙස ය. ඔහු පතොක් පත්‍රයක් අතින් අල්ලා උඩට උස්සා යමක් කීමට සැරසෙනවාත් සමග ම විද්‍යා සිසුන් කීප දෙනෙක් එක විට ම පැමිණ අප දෙන්නා අල්ලා අත් අඩංගුවට ගෙන රැගෙන ගියේ ආතර් සිල්වා සර් නම් වූ ගුරු මහතා ළඟට ය. ආතර් සර් තරමක් මිටි, සුදු කලිසම සහ සුදු කමිසය අඳින සැර පරුෂ, එමෙන් ම මහා ශබ්දයෙන් පාඩම් කියාදෙන ගුරුවරයෙකි. අප දෙදෙන ඔහු ළඟට ගෙනයන විට මාගේ දෙකකුල් වෙවුලන්නට වූයේ අද නම් ගුටි පූජාව නොවරදවා ම ලැබෙන බව දැනගෙන ය. ''මේ දෙන්න පතොක් ගහක් ගලවන්න හැදුවා.'' අප අල්ලාගෙන සිටින ළමයින් ගුරුවරයාට කරන ලද පැමිණිල්ල ය. ආතර් සර් වාඩි වී සිටි පුටුවෙන් නැගිට්ටා නොව ඉබේ නැගිටුණි. අප දෙදෙනාගේ මුහුණු දෙස බැලුවේ රෞද්‍ර විලාසයෙනි. ළඟට ආවේ වේගයෙනි. අප දෙදෙනාගේ ඔළුගෙඩි දෙකෙන් අල්ලා එකට හප්පා කෑ ගැසුවේ ''කෝ වේවැල'' කියා ය. අසලක වේවැලක් නොතිබිණි. වේවැලක් නොතිබීම හොඳයයි අපට ඇතිවුණු සොම්නස් සිතුවිල්ල මොහොතකින් විනාශ වී ගියේ ළමයකු කොහේදෝ ගොස් සොයාගෙන ආ තඩි වේවැල දැකීමෙනි. ආතර් සර් වේවැල ළමයාගෙන් උදුරා ගත්තේ වියරු වැටුණු අයකු ලෙස ය. වරම් ලද යකැදුරකුගේ වේෂයෙන් පළමුව මට පහර දෙන්නට ගත්තේ බිත්තිය පැත්තට හැරෙන්නට කියා තට්ටමට ය. ගුටි කන්නටත් පෙර මම මහා හයියෙන් විලාප දෙන්නට පටන් ගත් අතර මට පහර දෙකක් වදින විට මගේ හැඬුම් ශබ්දයටත් වඩා හඬමින් කෑ ගැසුවේ සෙනෙවිරත්න ය. ඔහුගේ හැඬුම් විලාසය දුටු මට දැනුණේ මගේ ගුටිකෑමේ වේදනාව අඩු වී හිත යටින් සිනාව මතුවන විලාසයකි. මට පාර හයක් එල්ල කොට ගැසූ විට එම පහරවල් ගැන්නේ අප අල්ලාගෙන පැමිණි ළමයින්ගෙන් කෙනෙකි. මගෙන් පසු සෙනෙවිරත්නට ද පහරවල් හයක් වැදුණි. අප ගුටි කන විට බලා සිටියේ මහා පිරිසකි. හැම මුහුණකම හැකර හිනා ය. අපට වදින වදින පහරක් ගානේ සිනා හඬ තීව්‍ර වෙයි.

වේවැල නැවැත් වූ ආතර් සර් එය මේසය මතට දමා අතින් මිට මොළවා දෙදෙනාගේ ම පිට මැදට පහරවල් දෙකක් ද දෙමින් පැවසුවේ ''මීට පස්සෙ මෙහෙට ආවොත් උඩ එල්ලලයි ගහන්නෙ. දැන් දුවපියව්. හයියෙන් දුවපියව්'' කියා ය. අප දුවන විට ළමයින්ගේ සිනාව මහා ඝෝෂා සිනාවක් බවට පත් වී තිබුණු අතර අප නැවතුණේ අපේ පන්තියට ගොසින් ය. තට්ටමේ වේදනාව සහ දිවීමෙන් ඇති වූ හතිය සෑහෙන වේලාවක් පැවතිණ. පතොක් ගසක් දකින විට එදා ඇති වූ තට්ටමේ වේදනාව දැනටත් දැනෙනවා සේ ය.

පාසලට බයිසිකල්වලින් පැමිණෙන සිසුන් බොහෝ දෙනෙකි. බයිසිකලයෙන් පැමිණෙන ගුරුවරුන්ගේ බයිසිකල් අතර ගමගේ මහතාගේ බයිසිකලය ද විය. එය පරණ බයිසිකලයක් වන අතර එහි පැඩිල් දෙක වෙනුවට තිබුණේ කූරු දෙක පමණි. අපේ පන්තියේ සිටි හේමේන්ද්‍ර ජයසිංහ නම් වූ ශිෂ්‍යයාට ඔහුගේ පියාවන ජයසිංහ දොස්තර මහතා රැලේ වර්ගයේ අලුත් ම බයිසිකලයක් මිල දී ගෙන තිබුණි. එය මිල දී ගත්තේ රුපියල් දෙසිය තිස්පහකට බව හේමේන්ද්‍ර ජයසිංහ අපට කියා තිබුණි. සිසුන් යහළුවන්ගේ බයිසිකල් ඉල්ලාගෙන පදින ආකාරය දෙස මා බලා සිටියේ වේදනාවෙන් මෙන් ම තරමක ඉරිසියාවෙනි. එයට හේතුව මට බයිසිකල් පදින්නට නොහැකි වීම ය. අනෙක් අයට පෙනෙන්නට බයිසිකල් පදින්නට මට උවමනාව තිබුණත් මගේ නොහැකියාව නිසා ඒ හපන්කම පෙන්වීමට නොහැකි වීම මහත් මදිකමක් සේ දැනුණි.

නිවසේ දී දිනක අපේ ගෙදර නවතා කොහේදෝ ගොස් සිටි දම්පරාදුගොඩ පියදාස අයියාගේ බයිසිකලයෙන් මට ද යන්තම් බයිසිකල් පැදීම පුහුණුවීමට අවස්ථාව ලැබුණි. ගෙදර වැඩිහිටි කිසිවකු නොසිටි නිසා සෝමපාල අයියාගේ උදව්වෙන් හිතේ හැටියට සයිකලය පාවිච්චි කිරීමට අවස්ථාව ලැබිණි. පළමුව පොල්ලට යටින් කකුල දමා පාගා යන්නට යන්තම් පුරුදු වී, ඉන්පසු ප්‍රේම් කඳට උඩින් කකුල දමා පාගන්නට සහ ෂීට් එකේ වාඩි වී යාමට තරමක් පුරුදු වීමි. දැන් මට බයිසිකල් පදින්නට පුළුවන් යන උද්දාමයෙන් මම පිම්බී ගියෙමි. ඊ ළඟ දිනයේ පාසලේ දී අපේ පන්තියේ මැන්ඩිස් ගේ බයිසිකලය ඉල්ලාගෙන පදින්නට සිතා ගත්තේ මටත් බයිසිකල් පදින්නට පුළුවන් බව අනිත් අයට පෙන්වන්නට ය. මැන්ඩිස්ගේ බයිසිකලය අනිත් බයිසිකල්වලට වඩා තරමක් පුංචි නිසා එය පැදීම පහසු ඇතැයි මම සිතුවෙමි.

එදින පාසලට යන තුරු මට ඉසපාසුවක් නැත. උදයේ ම මැන්ඩිස්ගේ බයිසිකලය ඉල්ලාගෙන පදින්නෙමි යැයි පාන්දර ම පාසලට ගිය ද, මැන්ඩිස් පැමිණියේ උදේ රැස්වීම පවත්වන වේලාවට ය. විවේක කාලය එනතුරු මට ඉස්පාසුවක් නැත. මගේ සයිකල් පැදීමේ හැකියාව අනිත් අයට පෙන්විය යුතු ය. විවේක කාලයේ දී මැන්ඩිස්ගෙන් බයිසිකලය ඉල්ලා ගත්තේ හිසේ කැක්කුම බව පවසමින් අතුරට ගොස් ඩිස්ප්‍රින් පෙත්තක් ගිල දමා ඒමට කියා ය.

මැන්ඩිස් නිර්ලෝභීව මට සයිකලයේ යතුර දුන්නේ ය. බයිසිකලය ළඟට දුවගෙන ගොස් ලොක් එක ඇර සයිකලය මිදුලට ගෙන නැග පාගන්නට පටන් ගතිමි. මිදුල මැදින් ළමයින්ගේ ඇඟේ නොහප්පා පල්ලමේ බ්‍රේක් අල්ලාගෙන කිතුල් ගහ යට වංගුවෙන් හෙමින් වමට හැරී ඉතා ප්‍රවේශමෙන් පැමිණ පාසල් පාරෙන් හොරණ-කලවැල්ලාව ප්‍රධාන පාරට වැටී අතුර පැත්තට ගියේ වෙනත් වාහන පාරේ එනවිට නවත්වා ඒවාට ඉඩ දීමෙනි. අතුරේ සිරිසඳ හෝටලයට ගොස් ඇල්වතුර වීදුරුවක් බී නැවත පාරෙන් අනිත් පැත්තට සයිකලය තල්ලු කරගෙන ගොස් එයට ගොඩ වී පාසල පැත්තට පැද්දෙමි. මහා වර්ෂාවක ලකුණු පෙනේ. අහස කළු කරමින් ගොරවමින් එක දෙක වැටුණු වැහි බිඳු මහා වර්ෂාවකට හැරුණි. පාසල් පාරට හැරුණු මම තරමක් වේගයෙන් සයිකලය පෑගුවෙමි. ඉස්කෝලේ කිතුල් ගහ යට වංගුවෙන් පාසල පැත්තට සයිකලය හැරවූවා මතක ය.

ඉන්පසු පෙනුණේ අපට ඉංග්‍රීසි උගන්වන වික්‍රමසිංහ සර් ගේ කළුපාට මයිනර් කාරයේ පසුපස වාඩි වී හොරණ පැත්තට යන අයුරු ය. මේ පහුවෙන්නේ ගෝවින්න හන්දිය වග මට යන්තම් පැහැදිලි වේ. මා ළඟ ලොකු කුමානායක වාඩි වී සිටී. සිදු වී ඇත්තේ කුමක් දැයි ඔහුගෙන් ඇසුවෙමි. මට දැනුමක් නැත. ඇඳුම් තෙමී ඇත. තැනින් තැන ඉරී ඇත. මගේ අතකින් ලේ ගලයි. මගේ මුහුණෙන් වැටෙන ලේ කමිසයට වැටී උරා ගනියි. එහෙත් මට වේදනාවක් නැත. නාරගල පාලම, බැල්ලපිටිය හන්දිය පසුකර ගොස් හොරණ රෝහල දෙසට කාරෙක හැරවෙනවා දුටු විට මේ මා රැගෙන යන්නේ රෝහලට බව තේරුම් ගැනීමට දැන් පුළුවන.

කුමානායක මා කාරයෙන් බස්සවා රෝහලට කැටුව ගියේ මගේ අතින් අල්ලාගෙන ය. ඔහු සමග යන මා දකින බොහෝ දෙනා විමතියෙන් මගේ මුහුණ දෙස බලති. ලෙඩුන් ඇතුළත් කර ගන්නා කාමරයේ දී මගෙන් ඇසූ ''මොකද වුණේ'' යන ප්‍රශ්නයට මගේ උත්තරය වූයේ ''දන්නෙ නෑ'' යන්න ය. ඇත්ත ඒක ය. සිදුවුණු දෙය මා දන්නේ නැත. මා කීවේ ඇත්ත ය.

''අපිට බාර ගන්න බෑ. ලොකුමහත්තය එනකං ඉන්න වෙයි'' එතැන සිටි වෛද්‍යවරයාගේ නිගමනය යි. ඔහු නැගිට කාමරයෙන් පිට විය.

''පියසේන මොකක්ද කීවෙ ඒ.? මොකද වැටුණායි කීවෙ නැත්තෙ?. දැන් ලොකු මහත්තය ආවහම කියනව බයිසිකලෙන් වැටුණායි කියල. නැත්තං අපිට පොලීසි ගානෙත් යන්න වෙයි.'' වික්‍රමසිංහ මහතා කීවේ කේන්තියෙනි.

මා නිශ්ශබ්දය.

විනාඩි ගණනාවකට පසු පැමිණි ලොකු දොස්තර මහතා මගේ මුහුණ දෙස බලා නිකටෙන් අල්ලා හිස උඩට ඔසොවා බලා තෙමී ඇති ඇඳුම් දෙස ද බලා ප්‍රශ්න කරයි.

''මොකක්ද නම?''
''පියසේන''
''මොකක්ද උනේ?''
''වැටුණා''
''කොහොමද වැටුණෙ?''
''බයිසිකලෙන්''
''කොහේ යන කොටද?''
''අතුරු ගිහින් එනකොට''
''අතුරු කිව්වෙ?''
''කඩ මණ්ඩිය'' ඒ උත්තරය දුන්නේ කුමානායක ය.

දොස්තර මහතා අමනාපයෙන් මෙන් ඔහු දෙස බලා නැවත මා දෙස බලා වික්‍රමසිංහ සර් පෙන්වා මගෙන් ඇසුවේ ඒ කවුදැයි කියා ය.

''ඉංග්‍රීසි සර්''
''මේ? ''
''කුමානායක''
''කුමානායක කවුද?''
''ඉස්කෝලෙ ළමයෙක්''

ලොකු දොස්තර මහතා කොළයක යමක් ලියා කුමානායක අතට දුන්නේ ය. වික්‍රමසිංහ සර් සහ කුමානායක මා කැඳවාගෙන ගියේ වෙනත් කාමරයකට ය.

කකුල් දෙක ද වැසෙන තරම් වූ දිග සුදුපාට කබායක් ඇඳ සිටි අයෙක් කාමරයට පැමිණියේ කිසියම් බඳුනක් ද රැගෙන ය. බඳුන පසෙකින් තැබූ ඔහු මා ළඟට පැමිණ නිකටෙන් අල්ලා ඔසවා දෙපැත්තට හරවහරවා බලා හිස යන්තමින් ඉහළට පහළට සෙලවූයේ නිශ්ශබ්දව ය. තැනින් තැන සීරී තිබුණු අත පය දෙස ද බැලූ ඔහු නැවත බඳුන ළඟට ගොස් ඉඳි කටුවකට නූලක් දමන්නට පටන් ගත්තේ ය. මට ඇඬුම් එයි. මුහුණේ මැහුම් දමන්නට තරම් තුවාල වී ඇති බව දැන් සිතා ගත හැකි ය. ඔහු මා ළඟට පැමිණ කුමානායකට කතා කොට මගේ හිසින් අල්ලා ගන්නා ලෙස පවසා ඉඳිකටුව මුහුණට කිට්ටු කළේ ය. හැඩිදැඩි කුමානායක ඉතා තදින් මගේ හිස නොසෙල් වෙන්නට අල්ලාගෙන සිටී. මට සෙලවීමටවත් නොහැකි වූයේ වික්‍රමසිංහ සර් ද මගේ දෑත අල්ලාගත් බැවිනි. මුහුණේ මැහුම් තුනක් ගසන තුරු මට එතරම් ම රිදීමක් ඇතිවුණේ නැත. එහෙත් හතරවෙනි, මැහුමේ දී වේදනාවෙන් කෙඳිරි ගෑ අතර පස්වෙනි මැහුම් ගසන විට හයියෙන් කෑ කැසුවේ ක්‍රමයෙන් රිදීම උත්සන්න වුණු නිසා ය. හිරිවැටී තිබුණු මුහුණේ මස ඉඳිකටු තුඩට හිරි ඇරෙන්නට ඇත.

මැහුම් ගසා අවසානයේ දී ප්ලාස්ටර් අලවා මුහුණේ කාර්යය අවසන් කොට තුවාල වී තිබූ අනිකුත් තැන්වලට බෙහෙත් පෙඟූ පුළුන් කැබැල්ලක් අතුල්ලා බෙහෙත් කුඩු දමා ප්ලාස්ටර් ඇලෙව්වේ ය. ජීවිතයේ පළමු වතාවට රෝහලක නැවතීමට සිදුවිය. හවස අම්මා සහ රයිගම පුංචි අම්මා රෝහලට පැමිණියේ අඬාගෙන ය. වරින් වර දවසෙන් දවස කවුරු හෝ රෝහලට මා බලන්නට පැමිණීම ගැන මා වඩාත් ම ප්‍රිය කළේ ඔවුන් ගෙනඑන නොයෙකුත් කෑම වර්ගවලින් මා ළඟ තිබූ පුංචි කබඩ් එක පිරවෙන නිසා ය.

රෝහලේ ගත වී දින හතරකට පසුව මැහුම් කපන විට මැහුම් දමනවාට වඩා වේදනාවක් ඇති වූවත් , මැහුම් කැපූ පුද්ගලයාගේ ක්ෂණික ක්‍රියාකාරිත්වය නිසා මගේ ළතෝනිය මැද මැහුම් පහම කැපීමට වැඩි වේලාවක් ගියේ නැත.

එදින දහවල් මට නිවසට ඒමට හැකියාව ලැබිණි. එදා ඇතිවුණු මුහුණේ කැලල අද වනතුරුම මුහුණේ පවතින්නේ සිහිවටන සමූහයක් ද ජීවිතයට එක් කරමිනි. පසුව දැනගත් කාරණාවන්ට අනුව මා අතුරට ගොස් එන අතර ඇතිවූ මහා වර්ෂාව මැද කිතුල් ගස ළඟින් හරවද්දී පැත්තක කාණුවට මා වැටී ඇත. වර්ෂාවේ එතැනින් ගිය දෙදෙනෙකු බයිසිකලයක් කාණුවේ වැටී තිබෙනු දැක විමසිලිමත් වීමේ දී බයිසිකලයට යටින් මගේ හිස පමණක් කාණු ගැට්ටේ එසවී තිබීම දැක ඇත. ශරීරයේ අනිත් හරිය කාණුවේ ය. කාණුවේ ගලා යන වතුර පාරින් හිස පමණක් බේරී ඇත්තේ කාණු ගැට්ටට හේත්තු වී තිබුණු නිසා ය. මා දුටු දෙදෙනා මා ඔසවා පාසලට ගෙන ගොස් බාර දී ඇත. මා ඔවුන් සමග පාසලට පයින් ගිය බව ද අසන ලද සියල්ලට උත්තර දුන් බව ද ඔවුහු පවසති.

1964 දෙසැම්බර් මස පවත්වන ලද අ.පො.ස. (සා.පෙ) විභාගයට පෙනී සිටි මට අංක ගණිතයට ''විශිෂ්ඨ'' සම්මානයක් සහිතව විෂයයන් හතකින් සමත් වීමට හැකියාව ලැබිණි. පාසලට ම ''විශිෂ්ඨ (ඩී)'' සම්මාන දෙකක් පමණක් වූ අතර එකක් මට සහ අනෙක බුද්ධාගම විෂය සඳහා මාලනී නම් වූ ශිෂ්‍යාවකට ය.

**මතු සම්බන්ධයි**



